# ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ තැන්පත් මැටි බඳුන් තුළින් හෙළිවන පුරාණ විදෙස් සබඳතා පිළිබඳ අධ්‍යයනයක්

එච්.පී. සමරනායක

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,
samaranayakaharsha99@gmail.com

**මුඛ්‍ය පද -** මැටි බඳුන්, සමුද්‍ර පුරාවිද්‍යාව, ශ්‍රී ලංකාව, විදෙස් සබඳතා

## හැඳින්වීම

මානව ශිෂ්ටාචාරයන් හි මෙන්ම ජීවයේ ඉතිහාසය ඇරඹුණු දා පටන්ම විවිධ යුගයන් අතික්‍රමණය කරමින් වර්තමානය දක්වා ම මිනිසා පසු කළ විවිධ අවධීන් සහ මානවයාගේ පරිණාමය හා සම්බන්ධ ද්‍රව්‍යාත්මක දෑ හි ඉතිහාසය පිළිබිඹු කරන්නා වූ ද, ක්‍රමානුකූලව ගබඩාකොට ප්‍රදර්ශනය කරන්නා වූ ද, ස්ථානයක් ලෙස කෞතුකාගාරය හඳුනාගත හැකිය. කෞතුකාගාරයක් හරහා ප්‍රධාන වශයෙන් ඕනෑම රටක ඉතිහාසය පුරාවිද්‍යාත්මක නශ්ඨාවශේෂයන් සහ ඓතිහාසික දත්තයන් තුළින් මනාව දෙස් විදෙස් පර්යේෂකයන් සඳහා ප්‍රදර්ශනය කිරීම සිදු කෙරේ. නූතන තාක්ෂණික උපාංගයන් හා ක්‍රමවේදයන් සමග පුරාවිද්‍යාව ද සංවර්ධනය වූ නිසාවෙන් ගොඩබිම මෙන්ම මුහුද හා එහි සැඟවී ඇති ඉතිහාසය හා උරුමයන් පිළිබඳව අවධානය යොමු කිරීමට මානවයා පෙළඹිනි. මුහුදු පතුළ දෙස කුතුහලයෙන් බලන මානවයා එය සිය පියවි ඇසින් දැක බලා ගැනීමට විවිධ උපක්‍රමයන් අත්හදා බැලීමටත් උනන්දු විය. මෙම උනන්දුවේ ප්‍රතිඵලයක් ලෙසට සමුද්‍ර පුරාවිද්‍යාව බිහි වූ අතර ඒ හරහා එතෙක් ජලයේ සැඟවී තිබූ පුරාවස්තු තුළින් මානව ඉතිහාසයේ නව සංධිස්ථානයක් අධ්‍යයනය කිරීමට මග පෑදුණි. ශ්‍රී ලංකාව ආර්ථික, සමාජීය, ආගමික, සංස්කෘතික හා දේශපාලනමය වශයෙන් ඉතා පුළුල් සම්බන්ධතාවයක් අනෙක් රටවල් සමග පැවැත් වූ බව පුරාවිද්‍යාත්මක හා ලිඛිත මූලාශ්‍රය තුළින් පැහැදිළි වේ. ශ්‍රී ලංකාවේ වටා පැවැති සමුද්‍රය මෙම සම්බන්ධතා වඩාත් තීව්‍ර වීමට හේතු වී ඇත. එම සම්බන්ධතාවලින් ලද ඇතැම් පුරාවිද්‍යා අවශේෂ අදටත් නොනැසී පවතින අතර මැටි බඳුන් නිෂ්පාදන ඒ අතර වැදගත් තැනක් උසුලයි. ඒ පිළිබඳ පුරාවිද්‍යාත්මක සාක්ෂි රැසක් ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ අන්තර්ගත වේ. එම මැටි බඳුන් නිෂ්පාදන හරහා මෙරට පැවැති විදේශ සම්බන්ධතාවයන් අධ්‍යනය කිරීම මෙහි මුඛ්‍ය අරමුණ වන අතර ඊට අමතරව මැටි බඳුන්වල උපයෝගීතාවය, නිෂ්පාදිත අමුද්‍රව්‍ය, නිෂ්පාදිත ආකාරය හා සුවිශේෂී ලක්ෂණ පිළිබඳ අධ්‍යනය මෙහි උප අරමුණ වේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික හා ද්විතියික මූලාශ්‍රයන් යොදාගත් අතර ක්ෂේත්‍ර අධ්‍යයනය යටතේ ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය අධ්‍යයනය සිදු කරන ලදි. එමෙන්ම පුස්තකාල අධ්‍යයනය, අන්තර්ජාලය අධ්‍යයනය හා ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරයේ නිළධාරීන් සමග සම්මුඛ සාකච්ඡා ද සිදු කරන ලදි.

## ප්‍රතිඵල හා සාකාච්ඡාව

පුරාවිද්‍යාත්මක අර්ථ නිරූපණ සඳහා බෙහෙවින් වැදගත් වන පුරාවස්තු, විවිධ ස්වරූපයේ දේශීය හා ජාත්‍යන්තර සබඳතා පිළිබඳ අධ්‍යයනය සඳහා යොදා ගන්නා ප්‍රබල සාධකයක් වේ. ශ්‍රී ලංකාවෙන් හමුවන පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති සෙරමික් හෙවත් මැටියෙන් කරන ලද මෙවලම් දේශීය සම්භවයක් මෙන්ම විදේශීය සම්භවයක් ඇති ද්‍රව්‍යාත්මක සාධක වේ. ශ්‍රී ලංකාවේ පුරාවිද්‍යාත්මක වටිනාකමක් ඇති ස්ථානවලින් සොයාගන්නා ලද විදේශීය මැටි බඳුන් රාශියක් ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ සංරක්ෂණය කොට ප්‍රදර්ශනයට තබා ඇත. එම මැටි බඳුන්වලින් විශාල ප්‍රමාණයක් දිවයිනේ පුරාතන වරායවල්

වන මාන්තායි, ගොඩවාය, ත්‍රිකුණාමලය, ගාල්ල ආදි වරාය ආශ්‍රිත ව සිදු කරන ලද සමුද්‍ර පුරාවිද්‍යා කැණීම් මඟින් හා අනුරාධපුර ඇතුළු නුවර, පොළොන්නරුව, යාපහුව ආදී අභ්‍යන්තර ස්ථාන ආශ්‍රිතව සිදු කරන ලද පුරාවිද්‍යා කැණීම් මඟින් හමු වූ ඒවා වේ.

මෙලෙස ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ තැන්පත් කොට ඇති ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවලින් හමු වූ මැටි භාජන අධ්‍යයනය කිරීමේ දී ඒවායෙහි අයිතිය ආසියානු කලාපය හා යුරෝපා කලාපයේ විවිධ රටවල් නියෝජනය කරන බව හඳුනා ගත හැකිය. එම රටවල් අතර චීනය, ඉන්දියාව, තායිලන්තය, පර්සියාව, ග්‍රීසිය, අරාබිය හා රෝමය ප්‍රධාන තැනක් ගන්නා අතර එම රටවල මැටි බඳුන් විශාල වශයෙන් හමු වීම තුළින් සරුසාර විදේශීය සම්බන්ධතාවයක් පැවති බව තහවුරු කර ගත හැක. කෞතුකාගාරය තුළ විශාල වශයෙන් චීන මැටි බඳුන් දැකගත හැකි අතර එම මැටි බඳුන් චීනයේ රාජ්‍යත්වය දැරූ උතුරු සුංග් රාජවංශය, දකුණු සුංග් රාජවංශය, මිංග් රාජවංශය, යුවාන් රාජවංශය, චිං රාජවංශය, තංග් රාජවංශය යන රාජ වංශ හයක කාල සීමාවකට අයත් වන බව හඳුනා ගත හැකි විය. මේ අනුව පුරා ශතවර්ෂ ගණනාවක පටන් චීනයේ සිට ගෙන එන ලද චීන මැටි බඳුන් මෙරට රජවරුන්ගේත්, ප්‍රභූවරුන්ගේත්, භික්ෂූන් වහන්සේලාගේත් චීනයේ සිට පැමිණි සංචාරකයින්ගෙත් පාවිච්චිය සඳහා රැගෙන ආ බව මෙන්ම ඒ හරහා චීනය හා ශ්‍රී ලංකාව අතර දියුණු විදේශීය සම්බන්ධතාවයක් පැවති බව සනාථ කළ හැක.

තවද විවිධ උපයෝගීතා අනුව මෙම නිෂ්පාදන සිදුකර ඇති අකාරය අධ්‍යයනය ඔස්සේ හඳුනාගත හැකි වූ අතර පානීය අවශ්‍යතා, සේදීම්, ගබඩා කරගැනීම, ආහාර තබා ගැනීම වැනි අවශ්‍යතා අනුව මෙම භාණ්ඩ නිෂ්පාදනය වී ඇත. නෞකාවලින් ගෙන එන ලද මෙම නිෂ්පාදන අතර වයින්, ජලය, මෙන්ම වෙනත් දෑ ගබඩා කිරීමත් සිදු වේ. පිඟන්, පීරිසි, කෝප්ප, කල, පියන් වර්ග, ගබඩා බඳුන්, මල් බඳුන් මෙම භාණ්ඩවලට අයත් ය. මෙම මැටි බඳුන් නිර්මාණය කර ඇති මෝස්තර රටා විවිධාකාරය. විවිධ වර්ණවලින් නිර්මාණය කර ඇති අතර සත්ත්ව රූප, විවිධ මෝස්තර, මල්කොළ, විවිධ රේඛා, ජ්‍යාමිතික හැඩතල, එහි දී හඳුනාගත හැක. ඒ තුළ මැටි බඳුන් නිර්මාණකරුවාගේ කලාත්මක චින්තනය ඉතාම හොඳින් නිරූපණය වේ. ඔහු සංස්කෘතිකමය තත්ත්වයන් හා ස්වභාව ධර්මය උපයෝගී කරගෙන මෙම මෝස්තර හා කලාංග නිර්මාණය කරගෙන ඇත. මෙහි දී නිර්මාණය සඳහා අමුද්‍රව්‍ය ලෙස විවිධ ඛණිජ ද්‍රව්‍ය උපයෝගී කරගෙන ඇත. විශේෂ මැටි මේ සඳහා යොදා ගැනෙන අතර, ද්‍රවශීලි මැටි ද්‍රාවණයන් ද යොදා ගෙන ඇත. මෙම මැටි බඳුන් ලංකාව වටා සමුද්‍ර වරායන් ආශ්‍රිතව මෙන්ම ඇතුළු නුවර, පොළොන්නරුව, යාපහුව ආදී ස්ථානවලින් හමුවන අතර මෙරට පුරාණ වරායන් ඉතා දියුණු වෙළඳ මධ්‍යස්ථාන විය. උක්ත අධ්‍යයන ප්‍රතිඵල හා සාකාච්ඡාව අනුව පුරාණ ශ්‍රී ලංකාව තුළ විදේශ සම්බන්ධතා පුළුල්ව පැවැත් වූ බවත් ඉතා හොඳ සංස්කෘතික සම්බන්ධතාවයක් තිබූ බවටත් ගාල්ල සමුද්‍ර පුරාවිද්‍යා කෞතුකාගාරය තුළ තැන්පත් මෙම මැටි බඳුන් නිෂ්පාදන තුළින් පෙනේ.

**ආශ්‍රිත මූලාශ්‍රය**


දිසානායක, ආර්. (2005). පුරාවිද්‍යාත්මක උපයෝගිතාව හා භාවිතය මැටි බඳුන්, ***පුරාතන ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය,*** ජාතික පුරාවිද්‍යා දින සමරු කලාපය, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

Orillaneda, B.C. (2016) Of ships and shipping the maritime archaeology of fifteenth century CE in Chumming W. (ed) ***South East Asia in Early navigation in the Asia Pacific Region,*** Springer, Singapore.

Deng, Q. (2016) The investigation and excavation of Xiaobaijiao no.1 shipwreck site of Qing Dynasty in East Sea of China in East Asia in Chumming W. (ed) ***South East Asia in Early navigation in the Asia Pacific Region,*** Springer, Singapore.